ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022-10-18 |

පැමිණිලි පාර්ශවය : එම්. ජ්. ආර්. රම්සාති මිය.
නො 6/2, හිරිඹුර පටුමග,
ගාල්ල.

වගඋත්තරකාර පාර්ශවය : 01. විදුහල්පති,
රිච්මන්ඩ් විද්‍යාලය,
ගාල්ල.

02. ලේකම්,
සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය,
රිච්මන්ඩ් විද්‍යාලය,
ගාල්ල.

03. ලේකම්,
අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය,
රිච්මන්ඩ් විද්‍යාලය,
ගාල්ල.

<u>පැමිණිලි අංකය : **HRC/MT/66/2019**</u>

ගාල්ල, හිරිමුර පටුමග, නො 6/2, ලිපිනයේ පදිංචි එම්. ජ්. ආර්. රම්සාති මිය විසින් තම දෙවන පුතු මුස්ලිම් සහෝදර අනුග්‍රහය ගණය යටතේ ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ 2019 වර්ෂයේ 1 වසර සඳහා ඇතුළත් කිරීමට අයදුම් කරන ලද නමුත්, තේරී පත් නොවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් පහත දක්වා සිටිනු ලබන කරුණු සැලකර සිටියි.

පැමිණිල්ලෙහි දක්වන පරිදි පෙත්සම්කාරියගේ වැඩිමහල් පිරිමි දරුවා 2016 වසරේ මෙම විදුහලට ඇතුළත් කිරීමට අයදුම් කරන ලද නමුත් තේරිපත් නොවූ හෙයින් ඒ ට අදාළව මෙම කොමිෂන් සභාව



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் } 011-2505451
ෆැක්ස් / தொலைநகல் } 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் } sechrcsl@gmail.com

වෙත HRC/MT/70/16/N යටතේ පැමිණිලලක් ගොනු කර ඊට අදාලව ලද නිර්දේශ මත දරුවා ඇතුලත් කර ඇත්තේ 2017 වසරේදී 2 වන ශ්‍රේණියටයි.

BR-I-03 යටතේ දෙවන දරුවා වන මොහොමඩ් ආතිෆ් සහෝදර අනුග්‍රහය යන ගණය යටතේ මෙම විදුහලට ඇතුලත් කිරීමට අයදුම් කරනු ලදුව සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 55.14 ක් උපයාගෙන ඇති අතර. ලකුණු පිළිබඳ පෙත්සම්කාරිය විදුහලට අභියාචනයක් ඉදිරිපත් කර ඇතත්. ලකුණු වල වෙනසක් සිදුව නොමැති අතර. කඩයිම් ලකුණට ළගා වීමට නොහැකි වීම මත දරුවාට පාසලට ඇතුලත් කරගෙන නැත.

සිය පැමිණිල්ල මගින් පැමිණිලිකාරිය කියා සිටින පරිදි පළමු දරුවා 1 ශ්‍රේණියට ඇතුලත් වූයේ නම් මෙම දෙවැනි දරුවාට ඒ අනුව ලකුණු 05ක් හිමි විය යුතුව ඇත. තවද පළමු දරුවා 1 ශ්‍රේණියේ සිට පාසලෙහි අධ්‍යාපනය ලැබුවේ නම් ශ්‍රේණියක් සඳහා ලකුණු 02ක බැගින් පළමු දරුවාට හිමි වන ලකුණු ප්‍රමාණය 06 ක් වන නමුත් පෙත්සම්කාරියට ලබා දුන්නේ ලකුණු 04ක් බව කියා සිටියි.

තවද කිතුලම්පිටිය ආනන්ද විදුහලට ආසන්න පාසලක් ලෙස සලකා ලකුණු 03ක් අහිමි කර ඇතත්. එම විදුහලට මුස්ලිම් දරුවන් ඇතුලත් කර නොගන්නා හෙයින් එසේ ලකුණු අහිමි කිරීම අසාධාරණ බවත්. ඊට අදාලව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - ගාල්ල වෙතින් ලබා ගත් ලිපියක් අභියාචනා පරීක්ෂණයට ඉදිරිපත් කලද ලකුණු සංශෝධනය කර ලබා නොදුන් බවත්. මෙලෙස තම දෙවැනි දරුවාට ලකුණු 10ක් අහිමිව ඇති බවත්. ප්‍රකාශ කර ඇත.. එසේ අහිමි වූ ලකුණු 10 හිමි වී නම් තම දරුවාගේ ලකුණු ප්‍රමාණය 65.14ක් බවට පත්ව තම දරුවාට පාසලට ඇතුලත් වීමට හැකියාව ලැබෙනු ඇති බවත්. වගඋත්තරකාර 01.02 සහ 03 යන අයගේ ක්‍රියාකාරිත්වයෙන් එම අවස්ථාව අහිමි වීමෙන් තමාගේ හා දරුවාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවටත්. තම දරුවාට සහනයක් සලසා දෙන ලෙසටත් පැමිණිල්ල මගින් ඉල්ලා ඇත.

පැමිණිල්ලට අදාලව 01 වන වගඋත්තරකාර පාර්ශවය සිය පිළිතුරු වාර්තාව මගින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ. චක්‍රලේඛනයේ 7.4.1.2 ඡේදය පරිදි ලකුණු ලබා දීමට හැකියාවක් නොමැත්තේ වැඩිමහල් දරුවා මෙම විදුහලට ඇතුලත් කර ඇත්තේ 2 ශ්‍රේණියට බැවින් වන බවයි.

එසේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර සත්‍ය බවට තහවුරු කර ගන්නා ලද ලේඛනය අනුව කිතුලම්පිටිය ආනන්ද මහ විදුහල සිංහල මාධ්‍ය ඉස්ලාම් ළමුන් ඇතුලත් කිරීමට හැකි පාසලක් බැවින් එම පාසලට අදාලව ලකුණු 03ක් අඩු විය යුතු බවත් චක්‍රලේඛ 24/2018 පරිදි උපරිම ලකුණු ලබා දී ඇති බවත් දක්වා ඇත.

මෙම පිළිතුරු ලිපිය සම්බන්ධව සිය විරෝධතාවය ගොනු කරමින් පැමිණිලිකාරිය දන්වා ඇත්තේ 2016 වසරේදී 1 ශ්‍රේණියට නිත්‍යානුකූලව ඇතුලත් විය යුතු තම පළමු දරුවාට එම අවස්ථාවේ අහිමි වූයේ

තම ප්‍රමාද දෝෂයකින් නොවන හෙයින් තම දෙවන දරුවාට සහෝදර ගණය යටතේ හිමි විය යුතු නිසි ලකුණු ලබා දී විදුහලට ඇතුලත් කර දෙන ලෙසයි.

මීට අදාලව පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද පරීක්ෂණයේදී පෙත්සම්කාරිය වෙනුවෙන් නිතිඥ දුමින්ද රාජපක්ෂ මහතා කරුණු දක්වමින් දන්වා ඇත්තේ, පලමු දරුවා 2016 වසරේදී මෙම විදුහලේ 1 ශ්‍රේණියට ඇතුලත් විය යුතු වුවත්, එය 2017 වසර දක්වා ප්‍රමාද වූයේ පෙත්සම්කාරියගේ ප්‍රමාදයක් නිසා නොවන බවයි. ඒ හේතුවෙන් පෙත්සම්කාරියට නැවත වරක් අගතියක් සිදුව ඇති බව කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත.

එබැවින්, පලමු දරුවා 1 ශ්‍රේණියට ඇතුලත් වුවා සේ සලකා දෙවැනි දරුවාට සහෝදර අනුග්‍රහය යටතේ හිමි විය යුතු ලකුණු ලබාදිය යුතු බව දන්වා ඇත.

වගඋත්තර පාර්ශවය විසින් කරුණු දක්වමින් සැලකර සිටින ලද්දේ ලකුණු ලබා දිම චක්‍රලේඛනය ප්‍රකාරව සිදු කල බවයි. මෙම දරුවා ලකුණු 55.14ක් ලබා ගත් බවත්, අදාල ගණයේ කඩයිම් ලකුණ ලකුණු 56ක් බවත් දන්වා ඇත.

**නිරීක්ෂණ =:**

01. පෙත්සම්කාරියගේ දරුවා ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ 2019 වසරේ 1 ශ්‍රේණියට සඳහා ඇතුලත් කිරීමට චක්‍රලේඛ අංක 24/2018 (පාසල්වල පලමු වන ශ්‍රේණියට ළමයින් ඇතුලත් කිරීම) හි 7.4 පරිදි එනම් **“ දැනටමත් අදාල පාසලේ අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ගේ සහෝදර සහෝදරියන් ”** යන ගණය යටතේ ඉල්ලුම් කර ලකුණු 55.14ක් ලබා ගෙන ඇති අතර, එම ලකුණු ප්‍රමාණය මෙම ගණයෙන් පාසලට තේරී පත්වීම සඳහා ප්‍රමාණවත් නොවන බව නිරික්ෂණය වේ.

02. පෙත්සම්කාරියගේ පලමු දරුවා 2016 වසරේදී මෙම විදුහලේ 1 ශ්‍රේණියට ආසනන්තාවය යටතේ ඇතුලත් කිරීමට ඉල්ලුම් කරන ලද නමුත් ලකුණු ප්‍රමාණවත් නොවීම මත මතු වූ කරුණු පිලිබඳව HRC/MT/70/16/N යටතේ මෙම කොමිෂන් සභාව හමුවේ නඩුවක් ගොනු කර ලද නිර්දේශ මත දරුවා 2017 වසරේදී 2 ශ්‍රේණියට ඇතුලත් කර ඇත.

03. ඒ අනුව සහෝදරයා 2017 වසරේදී 2 ශ්‍රේණියට ඇතුලත් වීම හේතුවෙන් මෙම දරුවාට සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු හිමි ව ඇත්තේ චක්‍රලේඛනයේ.

7.4.1.1 පරිදි අදාල පාසලේ ඉගෙනුම ලබන සහෝදර / සහෝදරියන් ඉගෙනුම ලබන ලද එක් ශ්‍රේණියක් වෙනුවෙන්. - (ලකුණු 02 බැගින් ලකුණු 20 - උපරිමය) - ලකුණු 04

(2017 හා 2018 වසර සඳහා)

7.4.1.2. පරිදි අදාල පාසලේ ඉගෙනුම ලබන ඉහත සඳහන් කල සහෝදරයා/ සහෝදරිය එම පාසලට පලමු ශ්‍රේණියට ඇතුලත්ව දැනට ඉගෙනුම ලබන්නේ නම් ලකුණු 05 - ලකුණු 0

| | | |
|---|---|---|
| 7.4.1.4 පරිදි විවිධාකාර සහයෝගය (ලකුණු) | - | ලකුණු 0.14 |
| 7.4.1.2 පරිදි පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය (ලකුණු 10) | - | ලකුණු 10 |
| 7.4.1.3 පරිදි ජන්ද ලියාපදිංචියට (ලකුණු20) | - | ලකුණු 20 |
| 7.4.1.5 පරිදි පාසලට ඇති ආසනන්නතාවයට (ලකුණු 30) | - | ලකුණු 21 |
| මුළු ලකුණු | | 55.14 |

වශයෙන් ලකුණු 55.14කි.

04. පෙත්සම්කාරියගේ පලමු දරුවා නිසි පරිදි මෙම විදුහලට ඇතුලත් වූයේ නම් ඇතුලත් විය යුත්තේ 2016 වසරේදි 1 ශ්‍රේණියට වන අතර, ඊට මතුව ඇති බාදාව පෙත්සම්කාරියගේ මැදිහත්වීමකින් තොර කරුණකින් සිදුව ඇති හෙයින් ඊට අදාලව ඇය විසින් ගොනු කර ඇති මානව හිමිකම් කොමිෂන් සභාවේ නඩුවෙන් පසු ලද නිර්දේශය යටතේ දරුවා 2017 වසරේ 2 ශ්‍රේණියට ඇතුලත් කර ඇත. ඒ අනුව චක්‍රලේඛනයේ 7.4.1.1 හි ලකුණු 05 දෙවන දරුවාට අහිමි වීම සිදුව ඇති අතර. එය පෙත්සම්කාරියගේ දෝෂයක් හේතුවෙන් සිදුව ඇත්තක් නොවන බව නිරීක්ෂණය වේ. එය එවක විදුහල් පරිපාලන ගැටළුවක් බව නිරීක්ෂණය වන අතර, එමගින් පෙත්සම්කාරියගේ පලමු දරුවාට 1 ශ්‍රේණියේ අධ්‍යාපන අවස්ථාව අහිමිව ඇති අතර, එම හේතුව මත මතුව ඇති මෙකී නඩු නිමිති හේතුවෙන් දෙවන දරුවාට ද අදාල විදුහලට ඇතුලත් විමට බාධා මතුව ඇති බවද නිරික්ෂණය වේ.

05. පලමු දරුවා 1 ශ්‍රේණියෙහි අධ්‍යාපනය නොලද බව සත්‍යයක් වන නමුත්, ඊට හේතු පාදක වී ඇත්තේ පෙත්සම්කාරියගේ මැදිහත් විමකින් තොර කරුණක් වන අතර, ඊට සෘජුව මෙම වගඋත්තර පාර්ශවයන් වගකිව යුතු බවක් නිරීක්ෂණය නොවුවද පෙත්සම්කාරියගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම විෂයෙහි පවත්නා රාජ්‍ය වගකීම යන තත්වය තුළ ඇය හා දරුවා විෂයෙහි ලකුණු ලබා දීමේදි යම් සාධාරණ දෘෂ්ඨියකින් බැලීම උචිත බව නිරීක්ෂණය වේ.

06. තවද පෙත්සම්කාරියගේ පලමු දරුවාට මෙම විදුහලෙහි 1 ශ්‍රේණියට 2016 වසරේදි ඇතුලත් වීමට ඉඩ ප්‍රස්ථාව අහිමිව ඇත්තේ එවකට විදුහලෙහි විදුහල්පති, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකලාපය හේතුවෙන් බවට HRC/MT/70/16/N ගොනුවට අදාලව ලද නිර්දේශයෙන් ප්‍රකාශිත බැවින්, අධ්‍යාපන විෂය සම්බන්ධ බලධාරින් මෙන්ම රජය විසින් එකී අවස්ථාවේදී අහිමි කරන ලද මූලික අයිතිවාසිකම් හේතුවෙන් පෙත්සම්කාරිය සහ ඇගේ දෙවන දරුවා විෂයෙහි දෙවන වරටද මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවීම කොමිෂන් සභාව අපේක්ෂා නොකරයි.

07. ඒ අනුව පෙත්සම්කාරියගේ පළමු දරුවාට 1 ශ්‍රේණියට නියමිත අධ්‍යාපනය ලැබීමට තිබූ අවස්ථාව එවකට අහිමි වුවා මෙන්ම දෙවන දරුවාට තම සහෝදරයාගේ අනුග්‍රහයෙන් මෙම පාසලට තේරී පත්වීම සඳහා අංක 24/2018 දරණ චක්‍රලේඛනය මගින් ලබා දී ඇති ඉඩප්‍රස්ථාව අහුරා දැමීම සාධාරණ නොවන බව නිරීක්ෂණය වේ.

08. ඒ අනුව චක්‍රලේඛන 7.4.1.1 පරිදි පෙත්සම්කාරිය විෂයෙහි ලකුණු 04ක් නොව 06ක් හිමි විය යුතු බවට පෙනී යයි.

09. එසේම 7.4.1.2 පරිදි ලකුණු 5 අහිමි කර ඇති නමුත් එකී ලකුණු 05 හිමිවිය යුතු බව නිරීක්ෂණය වේ.

10. 7.4.5 පරිදි අහිමිකර ඇති ලකුණු 03 සම්බන්ධව පෙත්සම්කාරිය විසින් ගාල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ විදුහල්පතිතුමා අමතන ලද ගා/කලාප/අධ්‍ය/12 පොදු හා 2018-11-21 දිනැති ලිපිය අභියාචනා පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද බව ප්‍රකාශ කලද ඊට අදාල කරුණු, පරීක්ෂණයේදී නිසි පරිදි ඔප්පු කර සිටීමට දෙපාර්ශවය අසමත් ව ඇති හෙයින් එම කරුණු දීර්ඝව සලකා බලා නැත.

11. එසේ වුවද පෙත්සම්කාරිය විෂයෙහි ලකුණු 07ක ඉහළ යාමක් සිදුවන හෙයින් ඇයගේ දරුවා අදාල ගණය යටතේ පාසලට දරුවන් තෝරා ගත් ලකුණු ප්‍රමාණය වන ලකුණු 56 ඉක්මවා ලකුණු 62.14ක් දක්වා ඉහළ යන බව පැහැදිලි වේ.

**නිගමනය =:**

එම ලකුණු ප්‍රමාණය මෙම සහෝදර අනුග්‍රහය ඉස්ලාම් ගණය යටතේ විදුහලට තේරී පත් වූ දරුවා ලද ලකුණු ප්‍රමාණය වන ලකුණු 56 ද ඉක්මවා යන ලකුණු ප්‍රමාණවත් වන හෙයින් මෙම සමස්ථ කරුණු අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් නීතිය ඉදිරියේ සමානාත්ම කමින් සැලකීම වගඋත්තරකරු විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය =:**

ඉහත නිගමනය අනුව1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින් පෙත්සම්කාරියගේ දරුවාට හිමි නියමිත ශ්‍රේණියට එම දරුවාව ඇතුලත් කිරීමට කටයුතු කිරීම සුදුසු බැවින්, ඒ අනුව ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විදුහල්පති, රිච්මන්ඩ් විද්‍යාලයට අදාල උපදෙස් ලබා දෙන ලෙස මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.11.24 වන දිනට පෙර එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධ පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විජිත නානායක්කාර,
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත = 01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්, - ඉහත නිර්දේශය අනුව කටයුතු කිරීමට
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
මාතර.

ඩ/- Ah